*අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2018*

## පෙරහුරු ප්‍රශ්න පත්‍රය - ක්‍රිස්තියානි ධර්මය

## 1 වන කොටස

(පැය 03 යි)

---

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අංක 1 සිට 40 තෙක් දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින්

නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(1) ජුදා සමාජය අදමිටු බව නමැති අඳුරෙන් වැසී තිබූ අවස්ථාවක කිතු උපත සිදු වීම.

1. සනදුරු දේශයේ විසුවන්ට ආලෝකයක් විය.
2. අධිරාජ්‍ය පාලනයෙන් නිදහස් වීමට අවස්ථාවක් විය.
3. ධර්මිෂ්ඨ සමාජයක ආරම්භය පමණක් සිදු වූ අවස්ථාවක් විය.
4. යුක්තිය පමණක් රජයන යුගයක ආරම්භක අවස්ථාවක් විය.

(2) ''සැබවින්ම යුක්තිය ඉටු කරන්නේය. එතුමා කලකිරෙන්නේවත් අධෛර්ය වන්නේවත් නැත.'' මෙම බයිබල් පාඨයෙන් කියවෙන්නේ,

1. ජේසුස් වහන්සේගේ සුවිශේෂ වූ උපත පිළිබඳවය.
2. ස්නාවක ජොහන් තුමාගේ මෙහෙය පිළිබඳවය.
3. ජේසුස් වහන්සේගේ විශිෂ්ඨ වූ මෙහෙවර පිළිබඳවය.
4. ස්නාවක ජොහන්තුමාගේ සේවකත්වය පිළිබඳවය.

(3) ''එතුමාණෝ යුක්තියෙන්ද ධර්මිෂ්ඨකමෙන්ද රජකම් කරන සේක.''
යෙසායා දිවැසිවරයා මෙයින් අදහස් කරන්නේ,

1. ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳවය.
2. දෙවියන් වහන්සේගේ කරුණාව පිළිබඳවය.
3. ශුද්ධාත්ම මගපෙන්වීම පිළිබඳවය.
4. ත්‍රිත්වයේ වැඩ විසීම පිළිබඳවය.

(4) ජේසුස් වහන්සේ අදහාගත් අයට පව්කමාවෙන් ගැලවීම ලැබේ.
මෙම සත්‍යතාවය සඳහන් වන්නේ,

1. මරිය තුමියගේ ප්‍රශංසා ගීතයේය.
2. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයේය.
3. නාසරෙත් ප්‍රකාශයේය.
4. මෝසෙස්ගේ ජය ගීතයේය.

5) එදා මෙන්ම අද කිතු සසුන තුළ පවතින විවිධ පිළිවෙත් තුළින් පෞද්ගලික දේව සම්න්ධතාවය ශක්තිමත් කරනු ලබන අවස්ථාවක් ලෙස ගත හැකි වන්නේ,

1. ශුද්ධ සහභාගිකම
2. ආශිර්වාදකාර බන්ධනය
3. රන් කිරි කට ගෑම.
4. බෞතීස්මය.

(6) ස්නාවක ජොහාන්තුමා පෙරමග දූත සේවයේදී ජනතාවට දුන් අනුශාසනාවක් වන්නේ,

1. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න.
2. ලාබ නොතකා සේවය කරන්න.
3. අඳනා දෙකක් ඇති අය නැති අයට දෙන්න.
4. අයුතු ලෙස අන් සතු දේ පැහැර නොගන්න.

(7) දේව රාජ්‍ය තුළ අප නිරතවන සේවයේ ප්‍රතිඵල පිළිබඳ අපට සතුටු විය හැක්කේ,

1. නපුරු බලය තමන්ට යටත් වන නිසා ය.
2. බොහෝ දෙනෙක් සුභාරංචියට කීකරු වන නිසාය.
3. ජේසුස් වහන්සේගේ සේවයට කැඳවනු ලැබීමේ උතුම්කම නිසා ය.
4. තමා ලබන ජනතා ප්‍රසාදය නිසා ය.

(8) දේව පවුලේ සමීප සබඳතාවයට ඇතුල්වන්නේ කවුරුන්ද?

1. දෙවියන් වහන්සේගේ කැමැත්ත තේරුම් ගෙන එය ඉටුකරන අය ය.
2. දිනපතා දේව වචනය කියවීමට කැමැත්ත දක්වන අය ය.
3. නොකඩවා ඉරුදින දේව මෙහෙයට සහභාගිවන අය ය.
4. තමාට ඇති දෙයින් යම් ප්‍රමාණයක් අන් අය සමඟ බෙදා ගන්නා අය ය.

(9) ජේසුස් වහන්සේ හා පරිසි/විනයධරයන් අතර පැවති සංවාද වලින් අපගේ ජීවිතවලට ගෙනෙන ප්‍රභල අභියෝගයක් වනුයේ,

1. පාපය සමඟ පව්කරුවාද ප්‍රතික්ෂේප කළ යුතුය යන්නය.
2. ස්ව ධර්මිෂ්ඨකම ගැන වඩාත් අවධානය යොමු කළ යුතු බව ය.
3. සියල්ල අතහැර බාහිර වත් පිළිවෙත් වලට යොමු විය යුතු බව ය.
4. දේව වචනය වචනාර්ථයෙන් පමණක් නොව, එහි ඇති හරය අවබෝධ කර ගත යුතු බව ය.

10) කිතුනු දරුවන් වන අපට මුහුණ දීමට සිදුවන අභියෝග වලදී අපගේ ප්‍රතිචාරයක් <u>නොවිය යුත්තේ,</u>

1. අවංකයන් ලෙස පෙනී සිටින වංක පුද්ගලයන්ගෙන් ප්‍රවේසම් වීම.
2. අන්මත හෙළා දකිමින් අපගේ විශ්වාසය පිළිබඳ වාද විවාදවල නිරත වීම.
3. සැබෑ ප්‍රශ්න හා එසේ නොවන ඒවා නිවැරදිව හඳුනාගෙන නිසි ප්‍රතිචාර දැක්වීම.
4. ජේසුස් වහන්සේ දෙවිඳුන් බව විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් සියලු අභියෝගවලට මුහුණ දෙමින් සේවය කිරීම.

(11) එකම රොටිය කඩා අනුභව කිරීමෙන් හා එකම කුසලානයෙන් පානය කිරීමෙන් සංකේතාත්මකව ගම්‍ය වන්නේ,

1. සමාජයේ පවතින පංතිභේද කිතුනුවන් නොසලකන බව ය.
2. සභාවේ පැවතිය යුතු සාමය ය.
3. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අකුරට පිළිපදින බව ය.
4. සහෝදරත්වය හා සහභාගිත්වය නොකඩවා පවත්වා ගැනීමේ අවශ්‍යතාවය ය.

(12) ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා'' යන ජේසුස් වහන්සේගේ යච්ඤාවේ හරය ජීවිතාදර්ශයෙන් විදහාපාන කිතුනුවා,

1. තමකම නසා දේව කැමැත්තට ජීවිතය යටත් කළ යුතුය.
2. අන් අය උදෙසා කළ හැකි මෙහෙවරක යෙදිය යුතුය.
3. තමා සතු ධනය දේව රාජ්‍ය උදෙසා වැය කළ යුතුය.
4. අවසානය තෙක් කිතුනුවෙකු ලෙස ජීවත්විය යුතුය.

(13) ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු ලෙස ක්‍රිස්තුස් වහන්සේ කුරුසිපත් කළ අවස්ථාවේ සත්‍යයට සාක්ෂි දැරුවේ,

1. කිරේනියේ සීමොන් ය.
2. දකුණු පස සිටි සොරා ය.
3. නිකොදේමුස් ය.
4. අරිමාතියේ ජෝසෙප් ය.

(14) ''ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක.'' යනුවෙන් සාක්ෂි දැරුවේ,

1. සොහොන වෙත ගිය කාන්තාවන් ය.
2. තෝමස් නම් ශ්‍රාවකයා ය.
3. එම්මාවුස් ගමට ගිය ගෝලයන් දෙදෙනා ය.
4. පේදුරු නම් ශ්‍රාවකයා ය.

(15) පහත සඳහන් සිදුවීම් අතරින් ජේසුස් වහන්සේගේ බෞතීස්මය සිදු වූ අවස්ථාවේදී ස්වර්ගයෙන් නික්ම ආ හඬ තුළින් ප්‍රකාශ වූයේ,

1. ''මේ මාගේ පුත්‍රයාණෝය, මොහුට සවන් දෙන්න.'' යන්නය.
2. ''ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි.'' දේව ප්‍රකාශය ය.
3. ''ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ප්‍රසන්නව සිටිමි.''
4. ''ඔබ දාවිත්ගේ පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ප්‍රසන්නව සිටිමි.''

(16) කිතුනු දරුවෙක් වන ඔබට පැමිණෙන පරීක්ෂා ජය ගත් හැකි වන්නේ,

1. ගුරුවරුන්ගේ උපදෙස් තුළිනි.
2. යාච්ඤාව හා දේව වචනය තුළිනි.
3. නොපසුබට උත්සාය තුළිනි.
4. ආගමික වතාවත් වලට සහභාගි වීම තුළිනි.

(17) ජුදෙව්වන්ගේ පිළිගැනීම අනුව දිවැසිවරුන්ගේ ප්‍රධානියා ලෙසත්, ව්‍යවස්ථාවේ ප්‍රධානියා ලෙසත් හඳුන්වනු ලැබූ පුද්ගලයන් පිළිවෙලින් ඇතුළත් වන වරණය වන්නේ,

1. එලිෂා, මෝසෙස් 3. එලියා, මෝසෙස්
2. යෙසායා, ආබ්‍රහම් 4. යෙසායා, මෝසෙස්

(18) දේව රාජ්‍යයේ ව්‍යවස්ථාව නොහොත් නීති මාලාව වන්නේ කුමක්ද?

1. දේව කැමැත්තය. 3. හෘදසාක්ෂිය ය.
2. දසපනතය. 4. ප්‍රේමය ය.

(19) ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීම සඳහා තෝරා ගත්තේ,

1. සුව කිරීම් 2. උපමා 3. දේව බල සලකුණු 4. ඉගැන්වීම් හෝ දේශනා

(20) දේව රාජ්‍යයේ පුරවැසිභාවය ලැබීමට අපේක්ෂා කරන අය තම ජීවිතයේදී මුහුණ දෙන වැදගත්ම අභියෝගය වන්නේ,

1. සමාව දීම 2. සාමුහිකත්වය 3. නිහතමානී වීම 4. වැය වීම.

(21) දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වන්නේ,
1. ජේසුස් වහන්සේගේ උත්ථානයයි.
2. ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමයි
3. ජේසුස් වහන්සේගේ මරණයයි.
4. ජේසුස් වහන්සේගේ උපත සිදු වීමයි.

(22) මෙසියස් වහන්සේගේ ජීවිතය හා පූජාව කරණකොටගෙන අපට අත් වන ප්‍රතිඵලයක් නොවන්නේ,

1. යුක්තිය උදෙසා පීඩා විඳීම
2. සියලු වහල් බැමි වලින් නිදහස ලැබීම.
3. පාපයෙන් මිදීම
4. අනාගත ධර්මිෂ්ඨ රාජ්‍යයක් බිහිවීම.

(23) ''කිසිවෙක් තමාට ස්වාමියාණෝ කියා නොගන්න. නායකයා සේවකයා විය යුතුය.'' යන ධර්මතාවය සේවයේ පදනම ලෙස සලකා කටයුතු කළේ,

1. ගරු පීටර් ජෙරාඩ් ද සිල්වා පියතුමා
2. ගරු තිස්සබාලසූරිය පියතුමා
3. දෙවන ජුවාම් පාවුලු පාප්වහන්සේ
4. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා

(24) සදාකාල ජීවනය උරුම කර ගැනීමට අත්‍යවශ්‍ය කාරනා අඩංගු පිළිතුර වන්නේ.

1. ධර්මිෂ්ඨකම, නිහතමානීකම, ශුද්ධකම
2. උතුම් ප්‍රීතිය, දයාව, ධර්මිෂ්ඨකම
3. උතුම් ප්‍රීතිය, ශුද්ධකම, ධර්මිෂ්ඨකම
4. ධර්මිෂ්ඨකම, ව්‍යවස්ථා පිළිපැදීම, ශුද්ධකම

(25) දරිද්‍රතාවය හමුවේ, ලෞකික දිළිඳු බව පිටු දැකීමට කිතුනු ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

1. සම්පත් නිසිලෙස බෙදා හැරීමට ඉඩදීම.
2. තමන් සතු සියලු වස්තු අත් හැරීම.
3. ධනවතාගෙන් ආයාචනා කිරීම.
4. තමාගේ අත්‍යඅවශ්‍ය නොවන වියදම් අවම කර ගැනීම.

(26) පහත සඳහන් කරුණු අතරින් කිතුනු ඔබට ශුද්ධකමේ ජීවිතයක් ගත කිරීමට තිබිය යුතු ගුණාංග ඇතුළත් වරණය වන්නේ,

A. දෙවිඳුන්ව ඇදහිය යුතුය.
B. හැසිරීමෙන් ශුද්ධව සිටිය යතුය.
C. ව්‍යවස්ථාව පමණක් පිළිපැදිය යුතුය.
D. දේව ගරුබිය ඇතිව සිටිය යුතුය.

1. D සහ A පමණක් නිවැරදිය
2. B සහ D පමණක් නිවැරදිය
3. C සහ B පමණක් නිවැරදිය
4. D සහ C පමණක් නිවැරදිය

(27) ආමොස් දිවැසිවරයා සමාජයට ඉදිරිපත් කළ පණිවිඩයකි

1. දේව රාජ්‍ය එළි දැක්වීම.
2. ශුද්ධත්වය
3. සමාජ සාධාරණත්වය
4. සාමයේ අභියෝගය

(28) මිසරයේ සිටි දේව ජනතාව වහල් භාවයෙන් මුදවා පොරොන්දු දේශයට ගෙන ඒමට නායකත්වය දුන්නේ,

1. ආරොන්, ආබ්‍රහම්, මෝසෙස්
2. ජොෂුවා, මෝසෙස්, ආරොන්
3. ආරොන්, ජෝසෙප්, මෝසෙස්
4. ජොෂුවා, ජෝසෙප්, ආරොන්

(29) ජේසුස් වහන්සේ යක්ෂ ආත්මදුරු කිරීම සහ මළවුන්ගෙන් නැගිටුවීම යන ප්‍රාතිහාර්යයන් තුළින් සමාජයට දුන් පණිවුඩය කුමක්ද?

1. විජාතීන්ට සැලකිය යුතුය යන්නයි.
2. මනුෂ්‍යත්වයට වඩා නීතියට ගරු කිරීමයි.
3. රෝගීන්ට අවශ්‍ය ශාරීරික සුවය දානය කිරීමයි.
4. මානසිකව හා ආත්මිකව පීඩා විඳින්නවන්ට මිදීම ලබා දීමයි.

(30) පාවුල් තුමාට රෝම පුරවැසිභාවය අත් පත් වූයේ,

1. ඔහුගේ පියාගේ පිය උරුමයක් ලෙසට ය.
2. ඔහු කළ ධර්මදූත සේවය හේතුකොටගෙන ය.
3. ඔහු ලද අධ්‍යාපන මට්ටම නිසා ය.
4. ධනවත් පවුලක උපත ලැබූ නිසා ය.

(31) සාවුල් සහ බාර්ණබස් පළමු ධර්මදූත ගමන සඳහා තෝරාපත් කර ගනු ලැබවේ,

1. මන්ත්‍රණ සභාවක් මගින් ය.
2. සභාවේ වැඩිහිටියන්ගේ මග පෙන්වීම තුළින් ය.
3. ශුද්ධාත්ම මග පෙන්වීම තුළින් ය.
4. පස ඇට දැමීමෙන් ය.

(32) තම දිවැසිවැකි වලදී අනාගත සමෘද්ධිමත් භාවය ගැන කතා කිරීමට මිදිවැල් සහ අත්තික්කා ගස් යොදා ගනු ලැබූ දිවැසිවරයා වූයේ,

1. යෙසායා 2. ආමොස් 3. එසකියෙල් 4. මීකා

(33) දෙවන ධර්මදූත ගමනේදී පාවුල් තුමා ජොහන් මාර්ක් ගෙන යාමට කමැති වූයේ,

1. දැඩි මතධාරියෙක් බැවිනි.
2. පළමු ගමනේ පර්ගායේදී හැරී ගිය බැවිනි.
3. බාර්ණබස්ගේ ඥාති පුත්‍රයා බැවිනි.
4. තීරණ ගැනීමේදී පසුබට වන බැවිනි.

(34) පාවුල් හා පිරිස තෙවන ධර්මදූත ගමන සාර්ථක කර ගැනීම සඳහා ගත් පියවර අපට අදාල වන්නේ,

1. ප්‍රේමයෙන් ක්‍රියා කිරීමටය.
2. ඉවසීමෙන් ක්‍රියා කිරීමටය.
3. දිරියෙන් හා  කැපවීමෙන් ක්‍රියා කිරීමටය.
4. නීතියට ගරු කරමින් ක්‍රියා කිරීමටය.

(35) ''ඔබගේ ශරීරය දෙවියන් වහන්සේට කැපකළ උන් වහන්සේට ප්‍රසන්න වූ ජීවමාන යාගයක් කොට ඔප්පු කරන මෙන් ඔබගෙන් හුදෙක්ම ඉල්ලමි.'' මෙම බයිබල් පදය සඳහන් වන්නේ,

1. රෝම පොතේ ය.
2. ගලාති පොතේ ය.
3. කොරින්ති පොතේ ය.
4. පිලිප්පි පොතේ ය.

(36) ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ නායකත්වය ගෙන ක්‍රියා කළේ,

1. බාර්ණබස් ය
2. පේදුරු ය.
3. සීලස් ය.
4. ජේසුස් වහන්සේගේ සහෝදරයෙක් වූ යාකොබ් ය.

(37) ප්‍රේමයේ පදනම මත තම ජීවිතය ගොඩ නගා ගනු ලබන ඔබ සවිමත් විය යුත්තේ,

1. යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙනි.
2. යාච්ඤාවෙන් හා විශ්වාසයෙනි.
3. විශ්වාසයෙන් හා ඇදහිල්ලෙනි.
4. ඇදහල්ලෙන් හා ඉවසීමෙනි.

(38) ''මෙන්න මම මෙහි ය. මා යැවුව මැනව.'' මෙසේ පැවසුවේ,

1. ජෙරමියා දිවැසිවරයා ය.
2. යෙසායා දිවැසිවරයා ය.
3. එසකියෙල් දිවැසිවරයා ය.
4. ආමොස් දිවැසිවරයා ය.

(39)

A. සාමයට කෙලවරක් නොතිබීම.
B. බලය තේජස වැඩිවර්ධනය කර ගැනීම.
C. දාවිත්ගේ සිහසුනේ වැඩ සිටීම.
D. යුක්තියෙන්ද ධර්මිෂ්ඨ කමින්ද රජකම් කිරිම.
ඉහත සඳහන් කරුනු අතරින් සාම යුගයේ ලක්ෂණ ඇතුළත් වරණය වන්නේ,

1. D සහ A ය.
2. D සහ C ය.
3. B සහ D ය.
4. A සහ B ය.

(40) ජුදෙව්වන්ගේ ප්‍රධානියෙක්ව සිටි නිකොදේමුස්

1. පූජකයෙකි.
2. නීතිවේදියෙකි.
3. උපස්ථාදායකයෙකි.
4. ගුරුවරයෙකි.



## 11 වන ශ්‍රේණිය
## ක්‍රිස්තියානි ධර්මය

## 11 වන කොටස

පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

①

i. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයට අනුව දේව සැලැස්මේ අරමුණු 2 ක් ලියන්න.

ii. නාසරෙත්හි සිනගෝගයේදී ජේසුස් වහන්සේ කළ ප්‍රකාශයට අනුව උන් වහන්සේගේ සේවය හිමි වන ජන කණ්ඩායම් 2 ක් නම් කරන්න.

iii. පරිසිවරු විසින් වරින් වර ජේසුස් වහන්සේට ඉදිරිපත් කළ චෝදනා 2ක් නම් කරන්න.

iv. දේව රාජ්‍යයේ කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේදී එහි ඇති භාරදූරකම වටහා දීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ නිදසුන් 2 ක් ලියන්න.

v. ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් දැක් වූ අවස්ථා 2 ක් නම් කරන්න.

vi. ''පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න.''

මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට පවසන ලද්දේදැයි ලියා එම ප්‍රකාශයේ ඇති වැදගත්කම ලියන්න.

vii. දේව රාජ්‍යයේ පුරවැසියන් තුළ තිබිය යුතු ප්‍රතිපත්තියක් නම් කොට ඒ පිළිබඳව ඉගැන්වීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමාවන් නම් කරන්න.

viii. මුල් කිතුනු සභාවේ ආරම්භක දිනය හඳුන්වන නම සඳහන් කොට එදින සිදු වූ විශේෂිත එක් සිදුවීමක් ලියන්න.

ix. යෙසායා දිවැසිවරයා පවසන පරිදි දුක් විඳින සේවකයාණෝ පිළිබඳ විශේෂිත කරුණු 2 ක් ලියන්න.

x. එපීස 6: 1-3 සඳහන් පරිදි කිතුනු දරුවන්ගේ වගකීම් 2 ක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

②

i. හුරු පුරුදු ස්ථානයක් වූ නාසරෙත් සිනගෝගය තුළදී ජේසුස් වහන්සේ කළ කාර්යයන් 2 ක් ලියන්න.

(ලකුණු 2 යි)

ii. නාසරෙත්හි ප්‍රකාශයට එරෙහි වූ ජනතාවට ජේසුස් වහන්සේ දැක් වූ ප්‍රතිචාර 3 ක් ලියන්න.

(ලකුණු 3 යි)

iii. ජේසුස් වහන්සේගේ මෙහෙවර නාසරෙත් ප්‍රකාශය තුළින් පැහැදිලි වේ. එය ආදර්ශයට ගනිමින් ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු 5 ක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 5 යි)

③

i. දේව රාජ්‍යයේ පුරවැසියන් තීරණාත්මක මොහොතකට මුහුණ දීම සඳහා සූදානම් විය යුතු ආකාරයන් 2 ක් ලියන්න.

(ලකුණු 2 යි)

ii. විශ්වාසී හා අවිශ්වාසී දාසයන් පිළිබඳ උපමා කථාව තුළින් අපේක්ෂා කරන සේවය පිළිබඳ කරුණු 3 ක් ලියන්න.

(ලකුණු 3 යි)

iii. ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ පරිදි පළල් දොරටුවෙන් ඇතුළුවන්නා විනාශයට පත් වේ. එලෙස වත්මන් සමාජයේ විනාශයට හේතුවන කරුණු 3 ක් ඉදිරිපත් කරමින් ඉන් මිදීමට ක්‍රියා කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 5 යි)

④

i. ජේසුස් වහන්සේ පහදා දුන් ආකාරයට දේව රාජ්‍යය යනු කුමක්ද?

(ලකුණු 2 යි)

ii. දේව රාජ්‍ය වර්ධනය පිළිබඳව ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උපමා කතා 3ක් නම් කරන්න.

(ලකුණු 3 යි)

iii. ඉහත උපමා අනුව දේව රාජ්‍ය වර්ධනයට ඔබට දායක විය හැකි ආකාරය කරුණු 5ක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 5 යි)

⑤

i. ඉශ්රායෙල් ජනයා අතර පැවති එඬේර වෘත්තියට අනුව එඬේර කාර්යය භාරයන් 2 ක් ලියන්න.

(ලකුණු 2 යි)

ii. ස්වාමින් වහන්සේට අයත් බැටලුවන් ලෙස අප ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව කරුණු 3ක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 3 යි)

iii. එඬේරෙක් ලෙස කිතුනු ඔබ සමාජය තුළ කටයුතු කරන්නේ කෙසේදැයි කරුණු 5ක් ඇසුරින් පහදන්න.

(ලකුණු 5 යි)

⑥

i. දෙවන ධර්මදූත චාරිකාව සඳහා පාවුල් සමඟ හවුල් නායකත්වයට යොමු වූවන් නම් කරන්න.

(ලකුණු 2 යි)

ii. පහත සඳහන් ස්ථාන අතරින් 3 ක් තෝරා ධර්මදූත සේවකයින් එම ස්ථානවලදී මුහුණ දුන් අභියෝගය බැගින් ඉදිරිපත් කරන්න.

a) පිලිප්පිය
b) ඇතන්ස්
c) තෙසලෝනිකය
d) කොරින්තිය

(ලකුණු 3 යි)

iii. බහුවිධ සමාජන් තුළ වෙසෙන කිතුනු ඔබ අභියෝග ඉදිරියේ ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි කරුණු 5ක් ඇසරින් පහදන්න.

(ලකුණු 5 යි)

⑦ පහත මාතෘකා අතරින් **දෙකක්** තෝරා කෙටි සටහන් ලියන්න.

i. ජයග්‍රාහි කිතුනු බලාපොරොත්තුව

ii. ස්නාවක තුමාගේ ඉගැන්වීම්

iii. කමාව පිළිබඳ ජේසුස් වහන්සේ ඉගැන්වීම් ජීවිතයට අදාල කර ගනිමු.

iv. දස පනතට අනුව ජීවිත ගොඩ නගමු

(ලකුණු 5x2= 10 යි)

# ක්‍රිස්තු ධර්මය
# පිළිතුරු පත්‍රය

## 1 වන කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|---|---|---|---|---|---|
| 1 | *1* | 11 | *4* | 21 | *2* | 31 | *3* |
| 2 | *3* | 12 | *1* | 22 | *1* | 32 | *4* |
| 3 | *1* | 13 | *4* | 23 | *4* | 33 | *2* |
| 4 | *2* | 14 | *3* | 24 | *3* | 34 | *3* |
| 5 | *4* | 15 | *2* | 25 | *1* | 35 | *1* |
| 6 | *3* | 16 | *2* | 26 | *2* | 36 | *4* |
| 7 | *3* | 17 | *3* | 27 | *3* | 37 | *1* |
| 8 | *1* | 18 | *4* | 28 | *2* | 38 | *2* |
| 9 | *4* | 19 | *2* | 29 | *4* | 39 | *2* |
| 10 | *2* | 20 | *3* | 30 | *1* | 40 | *4* |

(ලකුණු 1x40= 40 යි)

## 11 වන කොටස

අනිවාර්ය ප්‍රශ්නය

① i

- ඉශ්‍රායෙල් බොහෝ සෙනඟ දෙවි ස්වාමින් වහන්සේ වෙත හරවා ගනියි.
- මව්පියන් හා දරුවන් සමගි කිරීම
- පසුතැවිල්ලේ බෞතීස්මය ලබා දීම
- පෙරමග සූදානම

ii. දිළිඳුන්/වහලුන්/අන්ධයින්/පීඩිත වූවන්

iii.

- සබත කඩ කිරීම පිළිබඳ ප්‍රශ්නය
- උපවාසය පිළිබඳ ප්‍රශ්නය

iv.

- මුර අට්ටාලයන් සෑදීමට පෙර මුළු වියදම් බැලීම
- යුද්ධයට යාමට පෙර ප්‍රතිවාදියාට මුහුණ දීමට සංවිධානය වීම

v.

- ශ්‍රාවකයින්ගේ පාද සේදීම
- කුඩා දරුවන් අගය කිරීම
- සේවය අවශ්‍ය තැනට ගොස් ලබා දීම
- නිහතමානීව දිවි පිදීම

vi.

- ජේසුස් වහන්සේ විසින් ශ්‍රාවකයින්ට
- අපගේ ජීවිත අභියෝග හා පරීක්ෂාවන් ඉදිරියේ ජය ගැනීමට යාච්ඤාව වැදගත් වන බව.

vii.

- නැති වූවන් සොයා යෑම
- නැති වූ බැටලුවා/නැති වූ කාසිය/නැති වු පුත්‍රයා

viii.

- පෙන්තකොස්ත දිනය
- ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය සිදුවන ඕනෑම ආකාරයට ලකුණු පිරිනමන්න.

ix.

- දේව ආත්මානුභාවය ලබා සිටියි.
- මෘදු ලීලාවෙන් සැරසී සිටියි.
- දුක වේදනාව දරා ගනියි.

x.

- දෙමාපියන්ට කීකරු වන්න.
- මවටත් පියාටත් ගෞරව කරන්න.

(ලකුණු 2x10= 20 යි)

②

i.

- නමස්කාරයේ යෙදීම.
- ඉගැන්වීමේ යෙදීම

(ලකුණු 2 යි)

ii.

- දේව රාජ්‍ය අන්‍යයන් සඳහාද විවෘතව පවතින බව.
- තමන් වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබූ දිව්‍යසිව්වරිය ලෙස ජනතාවට දැනෙන්නට ඉඩ හැරීම.
- ප්‍රතික්ෂේප කිරීම් වලට උන් වහන්සේ ඉතා අභීතව මුහුණ දුන් බව.

(ලකුණු 3 යි)

iii.

- නාසරෙත් ප්‍රකාශය ඇසුරින් ලියා ඇති පිළිතුරට ලකුණු දෙන්න.

(ලකුණු 5 යි)

③

i.

- ඉඟපටි බැඳ ගන්න. (සූදානම්ව සිටීම)
- පහන් දල්වා තබා ගන්න. (118 - 10 ශ්‍රේණිය)
- අවදිව සිටීම
- නොඉවසිල්ලෙන් සිටීම.

(ලකුණු 2 යි)

ii.

- සෑම විටම සේවය කිරීම.
- දාස දාසීන්ට නිසි ලෙස සැලකීම.
- ආශාවන් කැප කිරීම.
- සංවිධානාත්මකව හා වගකීමෙන් සේවය ඉටු කිරීම.

(ලකුණු 3 යි)

iii. සුදුසු පිළිතුට ලකුණු දෙන්න.

(ලකුණු 5 යි)

④

i.

- දෙවියන් වහන්සේගේ අධිකාරත්වය හා රාජකීයත්වය තුළ ක්‍රියා කිරීම.
- පහන් දල්වා තබා ගන්න. (10 වන ශ්‍රේණිය - 80 වන පිටුව)

(ලකුණු 2 යි)

ii.

- අබ ඇටය/මුහුන්/වපුරන්නාගේ උපමාව

(ලකුණු 3 යි)

iii. සුදුසු පිළිතුට ලකුණු දෙන්න.

(ලකුණු 5 යි)

⑤

i.

- පෝෂනය/රැකබලා ගැනීම/මග පෙන්වීම
  (11 වන ශ්‍රේණිය - 7 වන පිටුව)

(ලකුණු 2 යි)

ii.

- එඬේරාගේ හඬට ප්‍රතිචාර දැක්වීම.
- පිටු පැමෙන් වන අන්තරාය අවබෝධ කර ගැනීම.
- කීකරු වීම. (11 වන ශ්‍රේණිය - 9 වන පිටුව)

(ලකුණු 3 යි)

iii. සුදුසු පිළිතුට ලකුණු දෙන්න.

(ලකුණු 5 යි)

⑥

i.

- පාවුල් /සීලස්/තිමෝතියස්

(ලකුණු 2 යි)

ii.

- තොරතුරු 11 වන ශ්‍රේණිය 59, හා 60, 62, ඇත.

(ලකුණු 3 යි)

iii.

- සුදුසු පිළිතුට ලකුණු දෙන්න.

(ලකුණු 5 යි)

⑦

කෙටි සටහන් සඳහා

1. 16 වන පාඩම (10 ශ්‍රේණිය පිටු 71 - 75)
2. 6 වන පාඩම (10 ශ්‍රේණිය පිටු 21-25)
3. 7 වන පාඩම ( 11 ශ්‍රේණිය පිටු 24 - 26)
4. 1 වන පාඩම ( 11 ශ්‍රේණිය පිටු 1-3)

(ලකුණු 5x2= 10 යි)